**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

**අභියාචනා අංක:- AAT/31/2022 (NPC)**

පී.පී.ඒ.සරත්චන්ද්‍ර

**අභියාචක**

**එදිරිව,**

පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2025.09.09**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා
වගඋත්තරකාර පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ, මාලා බස්නායක මහත්මිය.

**-<u>නියෝගය</u>-**

මෙම අභියාචනය සම්බන්ධයෙන්, දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කරන ලද දේශනවලට සහ ඉදිරිපත් කර ඇති අනෙකුත් ලේඛන වලටද, විනිශ්චය අධිකාරියේ අවධානය යොමු කරන ලදී. අභියාචක වෙනුවෙන් දන්වා සිටින්නේ, ඔහු වෙත නිකුත් කර ඇති විනය නියෝගය ලබා දී ඇත්තේ එවකට උතුරු පළාත භාර ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් බවයි. ඒ සමඟම අභියාචක මෙම වරද සිදු කළා යැයි කියනු ලබන අවස්ථාව වන විට මොනරාගල දිස්ත්‍රික්කයේ ඇතිමලේ පොලිස් ස්ථානයේ, ස්ථානාධිපති ලෙස කටයුතු කළ බවටත් කරුණු දන්වා සිටී. එවැනි තත්ත්වයක් යටතේ, පොලිස් ස්ථානාධිපතිවරයකු සම්බන්ධයෙන් වන විනය නියෝගයක් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට නිකුත් කිරීමට බලතල නොමැති බවට අභියාචක වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් දන්වා සිටී.

රජයේ සේවකයන් සම්බන්ධයෙන් වන, බලතල පැවරීමට අදාළව නිකුත් කර ඇති ගැසට් පත්‍රයට විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදී. එය අංක 1733/52 – 2011 හා නොවැම්බර් 25 දිනැති ගැසට් පත්‍රය වේ. එම ගැසට්

පත්‍රයේ II වන කොටසේ ශ්‍රී ලංකා පොලිස් සේවයේ නිළධාරීන් සම්බන්ධයෙන් වන බලතල පැවරීම පිළිබඳ කරුණු සඳහන් කර ඇත. එහි II වන කොටුවේ සඳහන් පරිදි පොලිස් ස්ථාන භාර නිළධාරීන් ඇතුළු ප්‍රධාන පොලිස් පරීක්‍ෂක සහ ඊට ඉහළ නිළයන් සම්බන්ධයෙන් වන විනය පාලනය පැවරී ඇත්තේ පොලිස්පතිවරයා වෙතය. දෙපාර්ශවයම පිළිගෙන ඇති පරිදි අභියාචක මෙම සිද්ධිය වන අවස්ථාව වන විට පොලිස් ස්ථානාධිපතිවරයකු වශයෙන් කටයුතු කර ඇති අතර ඔහු වෙත නිකුත් කර ඇති විනය නියෝගය ලබා දී ඇත්තේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු විසිනි. ඒ අනුව එම නියෝගය නිකුත් කිරීමට ඉහත ගැසට් පත්‍රය ප්‍රකාරව, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකුට බලතල ලැබී නැත. එවැනි බලයෙන් පිට, කිසියම් නිළධාරියෙකු කටයුතු කර තිබේ නම් හෝ යම් කිසි තීරණයක් ලබා දී ඇත්නම්, එම තීරණය ශූන්‍ය සහ බලරහිත වනවා ඇත. එකී නීතිමය කරුණු සළකා බලා අභියාචකට එරෙහිව, 2014.03.10 වන දින උතුරු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් අභියාචක සම්බන්ධයෙන් නිකුත් කර ඇති නියෝග බල රහිත නියෝගයන් බවට තීරණය කරමු.

ඉහත හේතූන් සළකා බලමින්, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට ඉඩ දීමට තීරණය කරමු.

ඉහත කී නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි පියවර ගන්නා ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

අභියාචනයට ඉඩ දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/-